# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2117/35 – 2019 අප්‍රේල් 03 වැනි බදාදා – 2019.04.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2017/248.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශවයක් වශයෙන් :*

එස්. බී. උදය පුෂ්පකුමාර මයා, අංක. 285, ගඟේයාය, ඇඹිලිපිටිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන් :*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බොරලැස්ගමුව, පිරිවෙන පාර, නො. 128, එස්. විරිතමුල්ල මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/248.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන් :*

එස්. බී. උදය පුෂ්පකුමාර මයා, අංක. 285, ගඟේයාය, ඇඹිලිපිටිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන් :*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඒකක කළමනාකරුවකු ලෙස සේවය කරන එස්. බී. උදය පුෂ්පකුමාර යන අය 2011.09.19 දින වැඩ තහනමට ලක් කර 2013.09.25 දිනැතිව එනම් වසර දෙකකට පසු චෝදනා පත්‍රයක් ලබා දී විනය පරීක්ෂණය සිදු කිරීම හෝ 2014.02.15 දිනැතිව පැනවූ විනය නියෝගය හේතුවෙන් හෝ එම කරුණු දෙකම හේතුවෙන් ඔහුට අසාධාරණයක් සිදුවීද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිලිබඳව වේ''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 09 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

04-583

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.